**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

# ඔරොත්තුදීම හා සියලුදෙනා ඇතුළත් ආර්ථික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමේ සාර්ව ප්‍රතිසාධන ආංශික සංවර්ධන වැඩසටහන

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ඔරොත්තුදීම හා සියලු දෙනා ඇතුළත් ආර්ථික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමේ සාර්ව ප්‍රතිසාධන අංශික සංවර්ධන වැඩසටහන (PROIR-SDP) යනු ශ්‍රී ලංකා රජය (GOSL) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) ඒකාබද්ධව අරමුදල් සපයන, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියකි. සමස්ත ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක් වන අතර, ශ්‍රී ලංකාවේ දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාවට සහය වීම සඳහා සැලසුම් කර ඇත. වසර 05 ක කාලසීමාවකින් යුත් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ ඔරොත්තු දීමේ හැකියාව සහ සුභසාධනය ශක්තිමත් කිරීමයි.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් තනතුරු (01 සිට 06 දක්වා) පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වැටුප 2026 මාර්තු 28 දිනැති අංක 02/2026 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය මත පදනම් වේ.

| අංකය | වැටුප් කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | A | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |
| 02 | C | ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥ | 01 |
| 03 | C | මෙහෙයුම් සහ ඇගයීම් විශේෂඥ | 01 |
| 04 | C1 | මූල්‍ය කළමනාකරණ විශේෂඥ | 01 |
| 05 | D | ප්‍රමාණ සමීක්ෂක | 01 |
| 06 | F | තාක්ෂණික නිලධාරී (I) | 02 |

**මූලික සුදුසුකම් සහ පළපුරුද්ද:**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට මූලික සුදුසුකම් සහ පළපුරුද්ද MSD චක්‍රලේඛ අංක 02/2026 ට අනුකූල විය යුතුය.

**පොදු කොන්දේසි:**

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු හැට දෙකට (62) නොවැඩි විය යුතුය.
- විදේශ ණය/ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක සමාන හෝ ඊට ඉහළ තනතුරක සේවා පළපුරුද්ද තිබීම.
- ප්‍රසම්පාදන, ගණකාධිකරණය, ව්‍යාපාර සහ අගයදම සංවර්ධනය, අලෙවිකරණය, ජීවනෝපාය සංවර්ධනය, සමාජ සංවර්ධනය සහ වැඩිහිටි රැකවරණය පිළිබඳ දැනුම විශේෂ වාසියක් ලෙස සලකනු ලැබේ.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, පරිගණක සාක්ෂරතාවය සහ රජයේ නීතිරීති හා රෙගුලාසි පිළිබඳ අවබෝධය අවශ්‍ය වේ.
- අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් තිබීම අතිරේක සුදුසුකමක් වේ.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන සහ තීරණාත්මක වේ.
- ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සියලුම අයදුම්පත් (CV), ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව පිළියෙල කර, අදාළ සහතිකවල පිටපත් සමග, පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ mssplan@yahoo.com වෙත විද්‍යුත් තැපෑලෙන් 2026 නොවැම්බර් 01 දින හෝ ඊට පෙර එවිය යුතුය.

අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

කාර්ය නියමයන් (Terms of Reference) ඇතුළු වැඩි විස්තර සඳහා mrds.gov.lk වෙත පිවිසෙන්න.

**ලේකම්,**
**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**
**01 වැනි මහල, II වැනි අදියර,**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල.**